30

ලෞකික ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දැක්ම

هُوَ الَّذِى جَعَلَ لَكُمُ الْأَرْضَ ذَلُولًا فَامْشُوا۟ فِى مَنَاكِبِهَا وَكُلُوا۟ مِن رِّزْقِهِۦ وَإِلَيْهِ النُّشُورُ

"නුඹලාට මහපොළොව වසඟ කළේ ඔහු ය. එහෙයින් එහි සියලු දිසාවෙන්හී ගමන් කරනු. ඔහු විසින් සම්පාදනය කළ දැයින් අනුභව කරනු. ඔහු වෙත ය, නුඹලා ආපසු නැගිටුවනු ලබන්නේ." (67 අල් මුල්ක් : 15)

ලෞකික ජීවිතය පිළිබඳ පැහැදිලි දැක්මක් මුස්ලිම්වරයකු ලබා තිබීම අත්‍යවශ්‍යය. එය ඔහුට මෙලොව ජීවිතය විධිමත් කර පරලොව ජීවිතයෙහි විමුක්තිය කෙරෙහි මං පාදයි. සැමවිට ම මෙලොව ජීවිතය පිළිබඳ වැරදි අවබෝධ තිබීම මුස්ලිම්වරකුගේ ජීවන අරමුණට බාධාවක් බවට පත් වේ.

ලෞකික ජීවිතය පිළිබඳ සාමාන්‍යයෙන් මිනිසුන් තුළ දක්නට ලැබෙන විවිධාකාර වූ දෘෂ්ටිකෝණ පාදක කොටගෙන ම ඔවුන්ගේ ක්‍රියාකාරකම් ද පවති. "මෙලොව සහමුලින් ම අතහැර ජීවත් විය යුතු යි, විමුක්තියට මාර්ගය එය ම වේ." යැයි මත පළ කරන්නෝ ද සිටිති. නො එසේ නම් මෙලොව ජීවිතය අපට ලැබී ඇති භාග්‍යයකි. එය නැවත හිමි වන්නේ නැත. එබැවින් ලද අවස්ථාව අප සහමුලින් ම භුක්ති විඳිය යුතු ය. එබැවින් එය උදාසීන කිරීම හෝ එයින් මිදී ජීවත් වීම අනුවණ ක්‍රියාවක් යැයි අදහස් කරන්නෝ ද සිටිති.

ඉස්ලාම් මේ අදහස් දෙක අතර මැදි වූ මධ්‍යස්ථ අදහසක් ඉදිරිපත් කරයි. එනම් ලෞකික ජීවිතය අත්හැරීම හෝ එයට ගිජු වීම ද නොකළ යුතු යි. තව ද මෙලොව ජීවිතය පරලොව ජීවිතය යැයි වෙන් කර බැලීම ද නොකළ යුතු ය. පරලොව ජීවිතය විමුක්තිය ම ඔහුගේ මූලික ඉලක්කය වුව ද මෙලොව ජීවිතය දියුණු කිරීම සඳහා ඉපැයීමට ද එය බාධා නොකරයි. තවත් ආකාරයකින් එය ඉබාදතයන් ලෙස සළකයි.

එබැවින් ලෞකික ජීවිතය සශ්‍රීක කිරීම ද ඒ සඳහා තම දැනුම මෙහෙයවා ගොවිතැන, විද්‍යාත්මක දේ, අත්කම් ආදිය සොයා ගැනීම් වැනි උත්සාහයන්හි නිරත වී, ඉපයීම යහපත් සේවයක් වේ. එය මිනිසා මත පැවරුණු මහා වගකීම් තුනෙන් එකක් වන "ඉමාරත්" යන සේවයෙහි එක් අංගයකි. "මෙලොව මුස්ලිම්වරයකුට ලෞකික ජීවිතය අතහැර ජීවත් විය නොහැකි ය. එලෙස ජීවත් වීම ද නොකළ යුතු ය." යන්න ද මෙමගින් ගෙනහැර දක්වයි.

මේ සඳහා නබි තුමාණන්ගේ කාලයේ සිදු වූ පහත සිදුවීම නිදසුනක් ලෙස දැක්විය හැකි ය. ලෞකික ජීවිතයෙන් ද එහි ආස්වාදයන්ගෙන් ද සහමුලින් ම මිදී සම්පූර්ණයෙන් ම තමා නැමදුම් කටයුතුවල පමණක් යොදවන බවට සහාබාවරු තිදෙනෙක් අදහස් කළහ. "රාත්‍රී කාලයේ මම අඛණ්ඩ ව සිටගෙන නැමදුම් කිරීමට අදහස් කරමි" යනුවෙන් පළමුවැන්නා ද "ජීවිත කාලය පුරා මම උපවාසයේ යෙදෙන්නට යන්නෙමි" යැයි දෙවැන්නා ද තම බිරිඳගෙන් ඈත් වී ජීවත් වන බවට තෙවැන්නා ද පවසන විට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් "ඔබ අතර අල්ලාහ්ට ඉතා බියෙන් ජීවත් වන මා රාත්‍රියේ නිදා ගනිමි; නැමදුම් කරමි; සුන්නත් වූ උපවාසය රකිමි; නොරැක ද සිටිමි; විවාහක ජීවිතයේ ද නිරත වෙමි. (බුහාරි) යැයි උපදෙස් දී "තම මග පෙන්වීම උදාසීන කරන්නන් මා අතර කෙනකු නොවේ." යයි තර්ජනය කිරීම නබි තුමාණන් පෙන්වූ ආදර්ශයට මහගු සාධකයකි. තව ද ලෞකික ජීවිතයේ තාපසයකු ලෙස ජීවත් වීම කෙරෙහි අවවාද කර "පැවිදි ජීවිතයක් ඉස්ලාමයේ නැත" (අහ්මද්) යැයි පැවසුවේ ය.

මෙලොව ජීවිතය පිළිබඳ අල් කුර්ආනයේ උපදෙස් පැහැදිලි ව හා පරිපූර්ණ ව අවබෝධ කර ගැනීම මගින් මෙලොව ජීවිතය හා පරලොව ජීවිතය අතර සමානත්වයක් ඇති කර ගත හැකි ය.

අල් කුර්ආනයේ සමහර වැකි දෙස බලන විට මෙලොව ජීවිතය අල්ප මාත්‍රයකි. රැවටිලි හා මායාවන් පරලොව ජීවිතය පාළු කර දමයි. මෙලොව ජීවිතය පරීක්ෂාවක් සඳහා ය, යන අදහස අපට ලැබේ. නිදසුන් ලෙස,

"මෙලොව ජීවිතයෙහි කෙළි සෙල්ලමත් විනෝදයත් මිස අන් කිසිවක් නැත. සැබවින් ම (අල්ලාහ් කෙරෙහි) බිය බැතිමත් අයට පරොලව ඉතා හොඳ ය. (මෙය) නුඹලා වටහා නොගන්නෙහි ද?" (6 අල් අන්ආම් ; 32)

"වස්තුව ද දරුවන් ද මෙලොව ජීවිතයේ අලංකාරයන් ය. සදාකල් පවතින යහකම් නුඹගේ රබ්ගේ(පරමාධිපති) ඵල විපාකයන්ගෙන් ඉතා හොඳ ය." (18 අල් කහ්ෆු ; 46)

"නුඹලාගේ වස්තු ද නුඹලාගේ දරුවන් ද පරීක්ෂාවකි. අගනා තිළිණ ඇත්තේ අල්ලාහ් වෙත ය." (64 අත්තහාබුන් ; 15)

තවත් සමහර වැකි දෙස බලන විට මෙලොව ජීවිතය වටිනා බව හා ලෝකය මිනිසාට වසඟ කර දී ඇති බවත් එබැවින් එයින් වැළකීම නොකළ යුතු ය, යන අදහසක් ගෙන දෙයි. නිදසුනක් ලෙස,

"නුඹලාට මහ පොළොව වසඟ කළේ ඔහු ය. එහෙයින් එහි සියලු දිසාවන්හි ගමන් කරනු; ඔහු විසින් සම්පාදනය කළ දැයින් අනුභව කරනු; ඔහු වෙත ය, නුඹලා ආපසු නැගිටවනු ලබන්නේ." (67 අල් මුල්ක් : 15)

"නුඹලා ගමනෙහි යෙදෙන දිනයේ දී ද නුඹලා නවාතැන් ගන්නා දිනයේ දී ද එය සැහැල්ලු යැයි නුඹලා දකින නිවසේ ද ඔහු (අල්ලාහ්) සතුන්ගේ සම් මගින් නුඹලාට ඇති කළේ ය. එසේ ම ඔවුන්ගේ සිනිඳු ලෝම මගින් ද ඔවුන්ගේ කෙඳිවලින් ද තව ද ඔවුන්ගේ කෙස්වලින් ද ඇඳුම් පැළඳුම් සහ (ගෙදර දොර) බඩු භාණ්ඩ ද ටික කලකට පරිහරණය සඳහා ඇති කළේ ය." (16 අන් නහ්ල් : 80)

මෙම වැකි දෙක මගින් අප පැහැදිලි එක් නිගමනයකට එළඹිය යුතු ය. එනම් පරලොව ස්ථාවර ආස්වාද ජනක ජීවිතය සමඟ මෙලොව ජීවිතය සසඳන කල මෙලොව ජීවිතය අල්පමාත්‍ර ය. එහෙත් පරලොව ජීවිත ජයග්‍රහණයේ මං පෙත ලෙස මෙලොව ජීවිතය දෙස බලන කල මෙලොව ජීවිතය නිසිලෙස මෙහෙයවීම මගින් ම පරලොව විමුක්තිය ලබා ගත හැකි වේ. මෙය නිෂ්ප්‍රභ කිරීමෙන් හෝ පැවිදි වීමෙන් පරලොව ජය ලබා ගත නොහැකි බැවින් මෙලොව ජීවිතයේ අති වැදගත් බව වටහා ගත හැකි ය.

මෙලොව ජීවිතය පිළිබඳ ඉතා නිවැරදි වැටහීමක් ලබා දීම සඳහා අල් කුර්ආනය මගින් ලබා දෙන මෙම ප්‍රාර්ථනාව අපට සහාය වේ.

"ඔවුන් අතරින් තවත් පිරිසක් අපගේ රබ් (පරමාධිපති) මෙලොව දීත් අපට ප්‍රශස්ත දේ දෙන්න, පරලොවදීත් අපට ප්‍රශස්ත දේ දෙන්න, තව ද අප නිරයේ ගින්නෙන් මුදවා ගනු මැනවයි, "(2 අල් බකරා : 201) ඉල්ලන්නෝ ද මිනිසුන් අතර සිටිති.

මිනිසුන් අතර සැම විට ම කොට්ඨාස දෙකක් දක්නට ලැබේ. ඔවුන් අතර එක් කොට්ඨාසයකගේ, සමස්ත අවධානය ම මෙලොව මත පවතියි, මෙලොව ප්‍රයෝජන-යන් ද එහි ආස්වාද ද හිමි කර ගැනීමෙහි ලා ඔවුහු උද්යෝගයෙන් සිටිති. මොවුන්ගේ ප්‍රාර්ථනා ද සැම විට ම මෙලොව ආස්වාද හා සැප සම්පත් ලබා ගැනීම ම අරමුණ කරගෙන වේ. ඔවුහු "අපගේ දෙවියනි! අපහට සියලු සම්පත් මෙලොව දී ලබා දෙනු මැන! යනුවෙන් ම ප්‍රාර්ථනා කරති. මිනිසුන් අතර මෙම පිරිස එදා මෙන් ම අද ද ලොව දක්නට ලැබේ. ඔවුන්ගේ මුළු ඉලක්කය ම මෙලොව වේ. මෙලොව සැප සම්පත් ලබා ගැනීම ද ආස්වාදයක් ලබා ගැනීම ද කෙරෙහි සැප ම ඔවුන්ගේ අවධානය යොමු වේ. අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන විට ද ඔවුහු මෙලොව සැප ම ඉල්ලා සිටිති. අල්ලාහ්ට මොවුන්ගේ කොටස මෙලොව දී ම ලබා දිය හැකි ය. එහෙත් පරලොවහි දී මොවුන් කිසි දු භාග්‍යයක් හිමි කර ගන්නේ නැත."යැයි පවසයි.

මිනිසුන් අතර සිටින අනෙක් කොට්ඨාසය මෙලොව ජීවිතය පිළිබඳ පුළුල් අරමුණක් ද විහිදී ගිය මනසක් ද, පැහැදිලි බැල්මක් ද ලැබ සිටිති. මොවුන් මෙලොව ජීවිතයේ යහපත අපේක්ෂා කළ ද පරලොව ද එහි වරප්‍රසාද ද අමතක නොකරති. ඔවුහු සැමවිට ම අල්ලාහ්ගෙන් දෙලොව යහපත ම ඉල්ලා සිටිති.

එබැවින් මුස්ලිම්වරයකුට මෙලොව පරලොව යන ජීවිත දෙක ම වැදගත් ය. එබැවින් ඒ දෙක ම සිහි තබා ගෙන කටයුතු කළ යුතු ය.

අල් කුර්ආනය මෙලොව ජීවිතය පමණක් පරමාර්ථය කර ගත් අය හෙළා දකියි. පරලොව ජීවිතය ද සම්බන්ධ කර බලන්නෝ කුර්ආනය මගින් ප්‍රංශසා ලබති. මෙම වර්ග දෙක හැර පරලොව පමණක් අපේක්ෂා කර තපස්භාවය ප්‍රිය කරන කොට්ඨාස අල්ලාහ් ප්‍රිය නොකළේ ය. එලෙස ජීවත් වීම ද ප්‍රායෝගික නොවේ.

එබැවින් මෙලොව ජීවිතය පිළිබඳ ඉතා නිවැරදි ඉස්ලාමීය දැක්ම පිළිබඳ පැහැදී, පරලොව ජීවිතයෙන් නිදහස ලැබීම සඳහා වූ එක ම මග පෙන්වීම ලෙස මෙලොව ජීවිතය පවත්වා ගෙන දෙලොව ජයග්‍රහණය ලැබීමට අල්ලාහ් අපට කරුණාව දක්වත්වා!

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❖ العِبادَةُ ❖ العِمَارَةُ ❖ الخِلَافَةُ

අභ්‍යාසය

1. මෙලොව ජීවිතය පිළිබඳ මුස්ලිම්වරයකුගේ අරමුණ කෙසේ විය යුතු ද?
2. මෙලොව සම්පත් පිළිබඳ අල් කුර්ආනයේ දැක්ම තර්ජමතුල් කුර්ආනය පරිශීලනය කර සොයා ලියන්න.
3. මෙලොව ජීවිතය හා පරලොව ජීවිතය පිළිබඳ මුස්ලිම්වරයකු අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුත්තේ කෙසේ ද?